# 1982 – කෘෂිකර්ම සංගණනය

## වතු ලැයිස්තු සකස් කිරීම සම්බන්ධව උපදෙස්

### 1. හැඳින්වීම

කෘෂිකාර්මික ව්‍යුහයට අදාල සංඛ්‍යාන දත්ත සපයා ගැනීම සඳහා කෘෂිකර්ම සංගණනයන් පැවැත්වීමට අරමුණු කර ඇත. එබඳු සංගණනයකදී "ගොවි කාණ්ඩය" තොරතුරු රැස් කිරීමේ ඒකකය වේ. පසුගිය සෑම කෘෂිකර්ම සංගණනයකදී මෙන්ම ගොවි කාණ්ඩ වැවිලි හෝ වතු අංශය සහ කුඩා ගොවි කාණ්ඩ අංශය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත.

### 2. "වත්ත" අර්ථ නිරූපනය

එකම කළමනාකරණ ඒකකයක් යටතේ වන අවම වශයෙන් භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි එක් බිම් කැබැල්ලක්වත් ඇති ගොවි කාණ්ඩය වත්තක් ලෙස සලකනු ලැබේ. මෙම වතු ප්‍රධාන කොටස් [illegible]ට බෙදනු ඇත.

ඒ කොටස: භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි සහ නේවාසික කම්කරුවන් 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සිටින

බී කොටස: භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි සහ නේවාසික කම්කරුවන් නොමැති හෝ 10 කට අඩු ප්‍රමාණයක් සිටින

සටහන:

1 භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩිවූ බිම් කැබැල්ල වී ගොවිතැනට හෝ හේන් ගොවිතැනට යොදා ගන්නා අවස්ථා වලදී එකම කළමනාකරන ඒකකයක් යටතේ පැවතිය නොහැකි නිසා එය වත්තක් නොවේ.

11 කුඹුරු හා ගොඩ ඉඩම් ද එක්ව ඇති අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි බිම් කැබැල්ලක් ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 20 කට අඩුව පවතින අවස්ථාවේදී වැඩි බිම් ප්‍රමාණයක් ගොඩ ඉඩම් වන්නේ නම් පමණක් වත්තක් ලෙස සැලකේ.

111 භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි වූ බිම් කැබැල්ලකින් යුක්තව එම කළමනාකාර ඒකකයටම අයත් වන කුඹුරු හෝ වෙනත් බිම් කැබලි වේනොත් ඒවා වත්තෙහි කොටස් ලෙස සැලකිය යුතුය.

1V ගොවි කාණ්ඩයකට අයත් වන බිම් කැබලි කීපයක භූමි ප්‍රමාණයන්ගේ එකතුව අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි වුවද එය වත්තක් නොවනු ඇත.

### 3. බිම් කැබැල්ල

බිම් කැබැල්ල යනු වෙනත් ගොවි කාණ්ඩයකට අයත් වූ බිමකින්, ජල මාර්ගයකින්, තැලෑවකින් හෝ පාරකින් මායිම් වී ඇති බිම් කොටසකි. එක් ගොවි කාණ්ඩයක බිම් කැබලි දෙකක් කිසි විටෙකවත් එකිනෙකට යාව පිහිටන්නේ නැත.

ඉඩමක ස්වභාවය අනුව හෝ වගා කරනු ලබන බෝග වර්ගය අනුව හෝ බිම් කැබැල්ලක් වෙන් කර දැක්විය නොහැකියි. එකම ගොවි කාණ්ඩයකට ගොඩ ඉඩමක්ද, අස්වැද්දන ලද කුඹුරු ඉඩමක්ද යාව පිහිටියේ [illegible] දෙකම එකම කැබැල්ලක් සේ සලකන්න.

විශාල ප්‍රමාණයකින් යුක්ත වත්තක, මැදින් දිවෙන, වත්තට අයත් පාරවල් මෙන් පොදු පාරවල් ද තිබිය හැක. එලෙසම වත්ත තුලම ඇති දිය පාරවල් ද පැවතිය හැක. එබඳු අවස්ථා නොසලකා හරින ලෙසක් භූමි ප්‍රමාණය මායිම් වන අවස්ථා ගැන සැලකිලිමත් වෙමින් බිම් කැබැල්ල හඳුනා ගන්නා මෙන්ද සඳහන් කරමි.

4. වත්තක් ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශ දෙකකට අයත් වන අවස්ථාව

එකම වත්තකට අයත් බිම් ප්‍රමාණය ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට හෝ වැඩි ගණනකට විහිදෙන අවස්ථා වලදී එම වත්ත, වත්තේ කාර්යාලය පිහිටි කොට්ඨාශයට අයත් ලෙස සලකන්න. කෙසේ වෙතත් අනෙකුත් කොට්ඨාශ භාර ග්‍රාම සේවා නිලධාරී වරුන්ද අදාල වත්තේ කොටසක් තම කොට්ඨාශයේ පිහිටි බවට තම වතු ලැයිස්තුවේ අවසානයේ දැක්විය යුතුය. කාර්යාලයක් නොමැති අවස්ථා වලදී වත්තේ වැඩි බිම් ප්‍රමාණයක් අයත් වන ග්‍රා. සේ. කොට්ඨාශයට වත්ත අයත් වන බව සලකන්න.

සං. වි. වරුන් තම ප්‍රා. උ. දි. කොට්ඨාශය සම්බන්ධ සම්පූර්ණ ලැයිස්තුව ඉදිරිපත් කිරීමට ප්‍රථම මේ අවස්ථා ගැන විශේෂ අවධානයකින් කටයුතු කළ යුතුය.

5. වතු ලැයිස්තු සකස් කිරීම

1981 ජන හා නිවාස සංගණනයේ අර්ථ නිරූපනය අනුව වතු අංශයේ ලා ගණන් ගැනිව් කෙරුණු වතු ලැයිස්තු අප වෙත ඇත. තවද උක්ත සංගණනයට ප්‍රථම සං. වි. වරුන් මඟින් භූමි ප්‍රමාණය අක්කර 50 ට වැඩි රජයේ, අක්කර 50 ට වැඩි පෞද්ගලික, අක්කර 20–50 අතර රජයේ සහ අක්කර 20–50 අතර පෞද්ගලික වශයෙන් කොටස් 4 කට බෙදා සකස් කරන ලද වතු ලැයිස්තුවද අප වෙත ඇත. මෙම වතු ලැයිස්තුව ආශ්‍රයෙන් ග්‍රාමසේවක කොට්ඨාශ මට්ටමින් සකස් කරන ලද වතු ලැයිස්තුවල පිටපත් සංඛ්‍යාලේඛන නිලධාරී වෙත එවනු ඇත.

(අ) සංඛ්‍යාලේඛන විමර්ශක නිලධාරීන්

තම ප්‍රා. උ. දි. කොට්ඨාශයේ ග්‍රා. සේ. කොට්ඨාශ සම්බන්ධයෙන් සකස් කරන ලද වතු ලැයිස්තු සහ සංශෝධිත වතු ලැයිස්තු අතිරේක පිටපතකින් යුක්තව සකස් කර ගැනීම සඳහා, ග්‍රාම සේවා නිලධාරීන් වෙත බෙදා දීමට අවශ්‍ය ආකෘතීන් සංඛ්‍යාලේඛන නිලධාරීන් විසින් ඔබ වෙත ලබා දෙනු ඇත.

ග්‍රාම සේවා නිලධාරී මඟින් තම කොට්ඨාශයන්හි වන උක්ත අර්ථ දැක්වීමට අනුකූල අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි බිම් ප්‍රමාණයක් වන සියලුම (ඒ සහ බී කොටස් එකට) වතු වල ලැයිස්තුවක් සකස් කළ යුතුය. 1981 නොවැම්බර් මාසයේ යෙදෙන කොට්ඨාශ දිනයකදී ග්‍රා. සේ. නි. අමතා මෙම ලැයිස්තුව සකස් කරන ආකාරය පැහැදිලි කරන්න. "වත්ත" "බිම් කැබැල්ල" සහ ගොවි කාණ්ඩය යන අර්ථ දැක්වීම් පහදා දෙන්න.

1981 ජන හා නිවාස සංගණනය සඳහා සකස් කරන ලද වතු ලැයිස්තුවේ පිටපතක් ඔවුන් වෙත ලබාදී ඇත්තේ ඊට උපකාර වනු පිණිසය. මෙම ලැයිස්තුව උපයෝගී කර ගනිමින් නිවැරදි සහ සම්පූර්ණ වතු ලැයිස්තුවක් ලබා දෙන ලෙස ග්‍රාම සේවා නිලධාරී වෙත උපදෙස් දිය යුතුය. එහිදී අප විසින් සපයන ලද වතු ලැයිස්තුව යම් යම් ප්‍රමාද දෝෂයන් නිසා සිදුවූ මගහැරීම් වලින් යුක්ත විය හැකි හෙයින් එයට සීමා නොවී තම කොට්ඨාශය තුල ඇති අර්ථ දැක්වීම් වලට අනුකූල වන වතු සියල්ලම ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න. එම ලැයිස්තුව අතිරේක පිටපතකින් ද යුතුව සකස් කළයුතු බවත් අදාල සෑම තීරුවක්ම සම්පූර්ණ කළයුතු බවත් අවධාරණයෙන් සඳහන් කරන්න. වතු නොමැති ග්‍රාම සේවක කොට්ඨාශ සම්බන්ධව ඒ බැව් සඳහන් කොට ආකෘතියක් ලබා ගත යුතුය.

අවශ්‍ය උපදෙස් සහ ආකෘති බෙදා දීමේ පටන් සම්පූර්ණ කරන ලද ලැයිස්තු සං. නි. වෙත භාර දීම දක්වා පරීක්ෂා කිරීමේදී තොරතුරු ද ඇතුලු ප්‍රගති වාර්තාවක් සං. නි. ඉල්ලා සිටින අවස්ථාවන්හිදී [illegible] යුතුය. ඉදිරි කාලය තුල මෙම කටයුතු සම්බන්ධව උපරිම ප්‍රමුඛතාවයක් දී ක්‍රියා කරන ලෙසද සඳහන් කරමි.

(ආ) සංඛ්‍යාලේඛන නිලධාරී

වතු ලැයිස්තු සකස් කිරීම් සම්බන්ධ උපලේඛන ඔබ වෙත ලැබුනු ඉක්මනින්ම කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන විමර්ශක නිලධාරීන් වෙත ඔවුන් සඳහා වන වතු ලැයිස්තු සහ උපලේඛන පෞද්ගලිකව හෝ ලියාපදිංචි තැපෑලෙන් ලබා දිය යුතුය. නියමිත කාලසීමාව තුල මෙම කටයුතු සම්පූර්ණ කර ගතයුතු බැවින් ඒ සඳහා උපරිම ප්‍රමුඛතාවයක් ලබා දෙන ලෙසත් සං. වි. න්ගේ යෝජිත වැඩ සටහන් අවශ්‍ය අයුරු සකස් කරවන ලෙසත් දන්වමි.

කොට්ඨාශ භාර සං. වි. වරුන්ගෙන්, අතිරේක පිටපතකින් යුක්තව ලැබෙන වතු ලැයිස්තු අදාල කොට්ඨාශයේ සියලුම ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශ සඳහා ලැබී ඇද්ද යන්න පරීක්ෂා කරන්න. (වතු නොමැති ග්‍රා. සේ. නි. කොට්ඨාශ සඳහා හිස් ආකෘතියක් තිබිය යුතුය) ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශ අනු පිළිවෙලින් තබා ප්‍රා. උ. දි. කොට්ඨාශ සඳහා වෙනම ලැයිස්තු දෙකක් (අතිරේක පිටපත ද ආධාර කොට ගෙන) සකස් කරන්න. මෙහි 1981 ජන හා නිවාස සංගණනයේදී වතු අංශයෙහි ලා ගණන් ගැනුනු වතු යටින් රතු පැන්සලයකින් ඉරක් ඇඳ එම ආකෘතියේ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා වන තීරය "ඒ" යයි සටහන් කරන්න. ජන හා නිවාස සංගණන වතු ලැයිස්තුවේ සඳහන් කේත අංකයද යොදන්න. වත්තේ නමෙහි වෙනසක් වේ නම් එයද සකස් කරන්න. අනෙකුත් සියලුම වතු සඳහා "බී" යයි සටහන් කරන්න.

මෙලෙස සියලුම ප්‍රා. උ. දි. කොට්ඨාශ සඳහා සම්පූර්ණ කරන ලද වතු ලැයිස්තුවේ මුල් පිටපත් 1981 දෙසැ: 20 දිනට ප්‍රථම නො: 25 ඒ විජේරාම මාවතේ කෘෂිකර්ම සංගණන අංශය වෙත එවිය යුතුය. අනික ඔබ කාර්යාලයේ ආරක්ෂිතව තැබිය යුතුය.

වතු ලැයිස්තුව සකස් කර ගැනීම සඳහා යෝජිත කාල සීමාවන් මෙසේය.

1. 1981 නොවැම්බර් මාසය තුල ආකෘතීන් ග්‍රාමසේවා නිලධාරීන් වෙත බෙදා හැරීම.

11. 1981 දෙසැම්බර් 10 දින හෝ ඊට ප්‍රථම සංශෝධිත වතු ලැයිස්තු ග්‍රා. සේ. නි. ගෙන් සං. වි. වරුන් වෙත ලබා ගැනීම.

111. 1981 දෙසැම්බර් 20 වැනිදාට ප්‍රථම දිස්ත්‍රික්කයේ සියලුම ග්‍රා. සේ. නි. කොට්ඨාශ සඳහා වූ වතු ලැයිස්තු ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගැනීම.

වතු ලැයිස්තු සකස් කිරීමේ උපලේඛන ඔබ වෙත ලැබුනු දින පටන් සංශෝධිත ලැයිස්තු ප්‍රධාන කාර්යාලය වෙත එවන දින දක්වා ප්‍රගති සටහන් තබා ගැනීම සඳහා වන ආකෘතියක් ද මේ සමඟ එවමි. මෙම සටහන ඔබේ පරීක්ෂාවන් සඳහා මෙන්ම ප්‍රධාන කාර්යාලයෙන් කෙරෙන පරීක්ෂාවන් සඳහා ද ප්‍රයෝජනවත් වන බැවින් කාලෝචිතව පවත්වාගෙන යා යුතුය. ඒ සඳහා අවශ්‍ය වන තොරතුරු සං. වි. වි. ගෙන් ලබා ගැනීමට පිළිවෙල යොදා ගන්නා ලෙස ද සඳහන් කරමි.

මේ ක්‍රියාවලිය යෝජිත කාල සීමාවන් තුල සම්පූර්ණ කර ගැනීමේ හෝ වෙනත් විශේෂ අපහසුතාවන් කොට්ඨාශ භාර සං. වි. වෙත ඇත්නම් හැකි ඉක්මනින් කෘෂිකර්ම සංගණන අංශය වෙත දන්වා එවන මෙන් ඉල්ලමි.

1981.10.29

කෘෂිකර්ම සංගණන අංශය,
25 ඒ, විජේරාම මාවත,
කොළඹ 7.

මගේ අංකය: 3/කෘ.සං./82/වතු

සංඛ්‍යාලේඛන නිලධාරී,

1982 – කෘෂිකර්ම සංගණනය
වතු අංශය

1982 ජූලි මාසයේ පැවැත්වීමට නියමිතව ඇති ඉහත සංගණනයේ වතු අංශය සංවිධානය කිරීම සඳහා නිවැරදි හා සම්පූර්ණ වතු ලැයිස්තුවක් සකස් කර ගැනීම අවශ්‍යය.

මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ පහත දැක්වෙන උපදෙස් පත්‍රිකා සහ උපලේඛන මේ සමඟ ඔබ වෙත එවමි.

1. වතු ලැයිස්තු සකස් කිරීම සම්බන්ධව සං. වි. වරුන් වෙත බෙදාදීම සඳහා උපදෙස් පත්‍රිකා.
11. අප වෙත ඇති වතු ලැයිස්තු ආශ්‍රයෙන් ග්‍රා. සේ. නි. කොට්ඨාශ මට්ටමින් සකස් කරන ලද වතු ලැයිස්තු (වතු සඳහන්ව තිබූ ග්‍රා. සේ. නි. සඳහා පමණක්).
111. එක් ග්‍රා. සේ. නි. වරයකුට අවම වශයෙන් දෙක බැගින් සියලුම ග්‍රා. සේ. නි. වෙත වතු ලැයිස්තු සකස් කිරීම සඳහා අවශ්‍ය ආකෘති
1V. සංඛ්‍යාලේඛන නිලධාරී වෙත ග්‍රා. සේ. නි. කොට්ඨාශ අනුව ප්‍රගති වාර්තා ලබා ගැනීම සඳහා ආකෘති.

වතු ලැයිස්තු සකස් කිරීම සම්බන්ධ උපදෙස් එම පත්‍රිකාවේ සඳහන්ව ඇත.

සම්පූර්ණ කරන ලද වතු ලැයිස්තු 1981 දෙසැම්බර් 20 වන දිනට ප්‍රථම පහත ලිපිනයේ වන කෘෂිකර්ම සංගණන අංශය වෙත ලබා දීම අත්‍යාවශ්‍ය බව අවසාන වශයෙන් ද සඳහන් කරමි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන
අධ්‍යක්ෂ වෙනුවට.

1981. නොවැ: 1 වැනි දින.
කෘෂිකර්ම සංගණන අංශය,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
25 ඒ, විජේරාම මාවත,
කොළඹ 7.

මගේ අංකය: 3/කෘ.සං./82/වතු

................ දිස්ත්‍රික්කයේ

දිසාපති හා සංගණන කොමසාරිස්,

## 1982 - කෘෂිකර්ම සංගණනය
## වතු අංශය

කෘෂිකාර්මික ව්‍යුහයට අදාල සංඛ්‍යාන එක්රැස් කිරීමේ අරමුණ ඇතිව දීපව්‍යාප්තව පවත්වනු ලබන කෘෂිකර්ම සංගණනය 1982 ජූලි මාසයේ පැවැත්වීමට නියමිතය. එබඳු සංගණනයකදී තොරතුරු රැස් කිරීමේ ඒකකය "ගොවි කාර්යය" වන අතර මෙම ගොවි කාර්ය වැවිලි හෝ වතු අංශය සහ කුඩා ගොවි කාර්ය අංශය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. ප්‍රධාන වශයෙන් අපනයනය සඳහා භෝගයන් වගා කෙරෙන වතු අංශය කෙරෙහි විශේෂ අවධානයකින් ක්‍රියා කළයුතුව ඇත. එම අංශයට අයත් වන සියලුම ඒකකයන්ගෙන් විස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට අදහස් කරන බැවින් සම්පූර්ණ හා නිවැරදි වතු ලැයිස්තුවක් අවශ්‍යය. එබැවින් ඔබ දිස්ත්‍රික්කයේ වතු ලැයිස්තුව සකස් කර ගැනීම සඳහා ඔබගේ සහාය බලාපොරොත්තු වෙමි.

1981 ජන හා නිවාස සංගණනයේදී සකස් කරන ලද වතු ලැයිස්තුවක් ආශ්‍රයෙන් ලබාගත් ග්‍රා. සේ. නි. කොට්ඨාශ වලට අයත් වන වතු ලැයිස්තුව අදාල ග්‍රා. සේ. නි. න් වෙත සපයනු ලැබේ. මෙම ලැයිස්තුවද ප්‍රයෝජනයට ගනිමින් අදාල අර්ථ දැක්වීම් වලට එකඟ වන්නා වූ තම කොට්ඨාශය තුල වන සියලුම වතු අඩංගු ලැයිස්තුවක් එම නිලධාරීන් මඟින් සකස් කරවා ගැනීමට අදහස් කරමි.

මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ උපදෙස් පත්‍රිකා සහ උපලේඛන සංඛ්‍යාලේඛන නිලධාරී මඟින් කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන විමර්ශක වරුන් වෙත යවා ඇත. එම නිලධාරීන් 1981 නොවැම්බර් මාසයේ ග්‍රා. සේ. නි. සඳහා වන කොට්ඨාශ දිනයකදී අවශ්‍ය අර්ථ දැක්වීම් හා උපදෙස් පැහැදිලි කොට උපලේඛන බෙදා දෙනු ඇත.

විදිමත් හා සම්පූර්ණ වතු ලැයිස්තුවක් සකස් කරවා ගැනීම සහ යෝජිත කාලසීමාවන් තුල ලබා ගැනීම සඳහා සහයෝගය දක්වන ලෙස කොට්ඨාශ භාර ප්‍රාදේශීය උප දිසාපති වරුන් වෙත උපදෙස් දෙන්නේ නම් කෘතඥ වෙමි.

සංගණන අධිකාරී හා
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1981 නොවැ: 02 දින.
කෘෂිකර්ම සංගණන අංශය,
25 ඒ, විජේරාම මාවත,
කොළඹ 7.

පිටපත්:
1. සියලුම ප්‍රා. උ. දි. - දැනගැනීම සඳහා
2. සංඛ්‍යාලේඛන නිලධාරීන් - දැනගැනීම සඳහා.

කෘෂිකර්ම සංගණනය - 1982

## වතු ලැයිස්තු සකස් කිරීමේ ප්‍රගති වාර්තාව.

ප්‍රා.උ.දි. කොට්ඨාශයන් සඳහා වූ මෙම වාර්තාව ප්‍රධාන කාර්යාලයෙන් වරින්වර අධීක්ෂණ සඳහා පැමිණෙන නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා යාවත් කාලීනව පවත්වා ගනිමින් සංඛ්‍යාලේඛන නිලධාරී වෙත තබා ගතයුතුය.

1. සං.වි. ගේ නම:-
2. ප්‍රා.උ.දි. කොට්ඨාශයේ නම:-
3. ග්‍රා.සේ.නි. කොට්ඨාශ අංකය:-
4. සං.වි. වෙත උපලේඛන ලබාදුන්/ තැපැල් කල දිනය:-
5. ප්‍රා.උ.දි. නි කොට්ඨාශ දිනය/ ග්‍රා.සේ.නි. වෙත උපදෙස් දුන් දිනය:-
6. වතු ලැයිස්තු ප්‍රගති පරීක්ෂා කිරීම්
   (වතු ලැයිස්තු ප්‍රගති පරීක්ෂා කිරීම සඳහා සං.වි. න්ගේ මාසික යෝජිත වැඩ සටහන් සකස් කිරීමට උපදෙස් දෙන්න.)

| ග්‍රා.සේ.කො. නම | සං.වි. පරීක්ෂා කළ දින (ප්‍රගති) | සං.නි. පරීක්ෂා කළ දින | වතු ලැයිස්තු ලබාගත් දින |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

7. ප්‍රා.උ.දි. කොට්ඨාශ සඳහා වන වතු ලැයිස්තු සංඛ්‍යාලේඛන නිලධාරී වෙත ලැබුණු දින:-

1982 – කෘෂිකර්ම සංගණනය

වතු ලැයිස්තු සකස් කිරීම සම්බන්ධව උපදෙස්

1. හැඳින්වීම

කෘෂිකාර්මික ව්‍යුහයට අදාල සංඛ්‍යාන දත්ත සපයා ගැනීම සඳහා කෘෂිකර්ම සංගණනයක් පැවැත්වීමට අරමුණු කර ඇත. එබඳු සංගණනයකදී "ගොවි කාණ්ඩය" තොරතුරු රැස් කිරීමේ ඒකකය වේ. පසුගිය සෑම කෘෂිකර්ම සංගණනයකදී මෙන්ම ගොවි කාණ්ඩ වැවිලි හෙවත් වතු අංශය සහ කුඩා ගොවි කාණ්ඩ අංශය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත.

2. "වත්ත" අර්ථ නිරූපනය

එකම කළමනාකරණ ඒකකයක් යටතේ වන අවම වශයෙන් භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි එක් බිම් කැබැල්ලක්වත් ඇති ගොවි කාණ්ඩය වත්තක් ලෙස සලකනු ලැබේ. මෙම වතු ප්‍රධාන කොටස් දෙකකට බෙදනු ඇත.

ඒ කොටස: භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි සහ නේවාසික කම්කරුවන් 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සිටින

බී කොටස: භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි සහ නේවාසික කම්කරුවන් නොමැති හෝ 10 කට අඩු ප්‍රමාණයක් සිටින

සටහන: 1 භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩිවූ බිම් කැබැල්ල වී ගොවිතැනට හෝ හේන් ගොවිතැනට යොදා ගන්නා අවස්ථා වලදී එකම කළමනාකරන ඒකකයක් යටතේ පැවතිය නොහැකි නිසා එය වත්තක් නොවේ.

11 කුඹුරු හා ගොඩ ඉඩම් ද එක්ව ඇති අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි බිම් කැබැල්ලක් ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 20 කට අඩුව පවතින අවස්ථාවේදී වැඩි බිම් ප්‍රමාණයක් ගොඩ ඉඩම් වන්නේ නම් පමණක් වත්තක් ලෙස සැලකේ.

111 භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි වූ බිම් කැබැල්ලකින් යුක්තව එම කළමනාකාර ඒකකයටම අයත් වන කුඹුරු හෝ වෙනත් බිම් කැබලි වෙතොත් ඒවා වත්තෙහි කොටස් ලෙස සැලකිය යුතුය.

1V ගොවි කාණ්ඩයකට අයත් වන බිම් කැබලි කීපයක භූමි ප්‍රමාණයන්ගේ එකතුව අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි වුවද එය වත්තක් නොවනු ඇත.

3. බිම් කැබැල්ල

බිම් කැබැල්ල යනු වෙනත් ගොවි කාණ්ඩයකට අයත් වූ බිමකින්, ජල මාර්ගයකින්, තැලෑවකින් හෝ පාරකින් මායිම් වී ඇති බිම් කොටසකි. එක් ගොවි කාණ්ඩයක බිම් කැබලි දෙකක් කිසි විටෙකවත් එකිනෙකට යාව පිහිටන්නේ නැත.

ඉඩමක ස්වභාවය අනුව හෝ වගා කරනු ලබන බෝග වර්ගය අනුව හෝ බිම් කැබැල්ලක් වෙන් කර දැක්විය නොහැකියි. එකම ගොවි කාණ්ඩයකට ගොඩ ඉඩමක්ද, අස්වැද්දන ලද කුඹුරු ඉඩමක්ද යාව පිහිටියේ නම් ඒ දෙකම එකම කැබැල්ලක් සේ සලකන්න.

විශාල ප්‍රමාණයකින් යුක් වත්තක, මැදින් දිවෙන, වත්තට අයත් පාරවල් ගමන් පොදු පාරවල් ද

4. වත්තක් ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශ දෙකකට අයත් වන අවස්ථාව

එකම වත්තකට අයත් බිම් ප්‍රමාණය ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට අගර් වැඩි ගණනකට විහිදෙන අවස්ථා වලදී එම වත්ත, වත්තේ කාර්යාලය පිහිටි කොට්ඨාශයට අයත් ලෙස සලකන්න. කෙසේ වෙතත් අනෙකුත් කොට්ඨාශ භාර ග්‍රාම සේවා නිලධාරී වරුන්ද අදාල වත්තේ කොටසක් තම කොට්ඨාශයේ පිහිටි බවට තම වතු ලැයිස්තුවේ අවසානයේ දැක්විය යුතුය. කාර්යාලයක් නොමැති අවස්ථා වලදී වත්තේ වැඩි බිම් ප්‍රමාණයක් අයත් වන ග්‍රා. සේ. කොට්ඨාශයට වත්ත අයත් වන බව සලකන්න.

සං. වි. වරුන් තම ප්‍රා. උ. දි. කොට්ඨාශය සම්බන්ධ සම්පූර්ණ ලැයිස්තුව ඉදිරිපත් කිරීමට ප්‍රථම මේ අවස්ථා ගැන විශේෂ අවධානයකින් කටයුතු කළ යුතුය.

5. වතු ලැයිස්තු සකස් කිරීම

1981 ජන හා නිවාස සංගණනයේ අර්ථ නිරූපනය අනුව වතු අංශයේ ලා ගණන් ගැනීම් කෙරුණු වතු ලැයිස්තු අප වෙත ඇත. තවද උක්ත සංගණනයට ප්‍රථම සං. වි. වරුන් මගින් භූමි ප්‍රමාණය අක්කර 50 ට වැඩි රජයේ, අක්කර 50 ට වැඩි පෞද්ගලික, අක්කර 20-50 අතර රජයේ සහ අක්කර 20-50 අතර පෞද්ගලික වශයෙන් කොටස් 4 කට බෙදා සකස් කරන ලද වතු ලැයිස්තුවද අප වෙත ඇත. මෙම වතු ලැයිස්තුව ආශ්‍රයෙන් ග්‍රාමසේවක කොට්ඨාශ මට්ටමින් සකස් කරන ලද වතු ලැයිස්තුවල පිටපත් සංඛ්‍යාලේඛන නිලධාරී වෙත එවනු ඇත.

(අ) සංඛ්‍යාලේඛන විමර්ශක නිලධාරීන්

තම ප්‍රා. උ. දි. කොට්ඨාශයේ ග්‍රා. සේ. කොට්ඨාශ සම්බන්ධයෙන් සකස් කරන ලද වතු ලැයිස්තු සහ සංශෝධිත වතු ලැයිස්තු අතිරේක පිටපතකින් යුක්තව සකස් කර ගැනීම සඳහා, ග්‍රාම සේවා නිලධාරීන් වෙත බෙදා දීමට අවශ්‍ය ආකෘතීන් සංඛ්‍යාලේඛන නිලධාරීන් විසින් ඔබ වෙත ලබා දෙනු ඇත.

ග්‍රාම සේවා නිලධාරී මගින් තම කොට්ඨාශයන්හි වන උක්ත අර්ථ දැක්වීමට අනුකූල අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි බිම් ප්‍රමාණයක් වන සියලුම (ඒ සහ බී කොටස් එකට) වතු වල ලැයිස්තුවක් සකස් කළ යුතුය. 1981 නොවැම්බර් මාසයේ යෙදෙන කොට්ඨාශ දිනයන්දී ග්‍රා. සේ. නි. අමතා මෙම ලැයිස්තුව සකස් කරන ආකාරය පැහැදිලි කරන්න. "වත්ත" "බිම් කැබැල්ල" සහ ගොවි භාණ්ඩය යන අර්ථ දැක්වීම් පහදා දෙන්න.

1981 ජන හා නිවාස සංගණනය සඳහා සකස් කරන ලද වතු ලැයිස්තුවේ පිටපතක් ඔවුන් වෙත ලබාදී ඇත්තේ ඊට උපකාර වනු පිණිසය. මෙම ලැයිස්තුව උපයෝගී කර ගනිමින් නිවැරදි සහ සම්පූර්ණ වතු ලැයිස්තුවක් ලබා දෙන ලෙස ග්‍රාම සේවා නිලධාරී වෙත උපදෙස් දිය යුතුය. එහිදී අප විසින් සපයන ලද වතු ලැයිස්තුව යම් යම් ප්‍රමාද දෝෂයන් නිසා සිදුවූ මගහැරීම් වලින් යුක්ත විය හැකි හෙයින් එයට සීමා නොවී තම කොට්ඨාශය තුළ යට කී අර්ථ දැක්වීම් වලට අනුකූල වන වතු සියල්ලම ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න. එම ලැයිස්තුව අතිරේක පිටපතකින් ද යුතුව සකස් කළයුතු බවත් අදාල සෑම තීරුවක්ම සම්පූර්ණ කළයුතු බවත් අවධාරණයෙන් සඳහන් කරන්න. වතු නොමැති ග්‍රාම සේවක කොට්ඨාශ සම්බන්ධව ඒ බැව් සඳහන් කොට ආකෘතියක් ලබා ගත යුතුය.

අවශ්‍ය උපදෙස් සහ ආකෘති බෙදා දීමේ පටන් සම්පූර්ණ කරන ලද ලැයිස්තු සං. නි. වෙත බාර දීම දක්වා පරීක්ෂා කිරීමේදී තොරතුරු ද ඇතුලු ප්‍රගති වාර්තාවක් සං. නි. ඉල්ලා සිටින අවස්ථාවන්හිදී ... යුතුය. ඉදිරි කාලය තුල මෙම කටයුතු සම්බන්ධව උපරිම ප්‍රමුඛතාවයක් දී ක්‍රියා කරන ලෙසද සඳහන් කරමි.

(ආ) සංඛ්‍යාලේඛන නිලධාරී

වතු ලැයිස්තු සකස් කිරීම් සම්බන්ධ උපලේඛන ඔබ වෙත ලැබුනු ඉක්මනින්ම කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන විමර්ශක නිලධාරීන් වෙත ඔවුන් සඳහා වන වතු ලැයිස්තු සහ උපලේඛන පෞද්ගලිකව හෝ ලියාපදිංචි තැපෑලෙන් ලබා දිය යුතුය. නියමිත කාලසීමාව තුල මෙම කටයුතු සම්පූර්ණ කර ගතයුතු බැවින් ඒ සඳහා උපරිම ප්‍රමුඛතාවයක් ලබා දෙන ලෙසත් සං.වි. න්ගේ යෝජිත වැඩ සටහන් අවශ්‍ය අයුරු සකස් කරවන ලෙසත් දන්වමි.

කොට්ඨාශ භාර සං.වි. වරුන්ගෙන්, අතිරේක පිටපතකින් යුක්තව ලැබෙන වතු ලැයිස්තු අදාල කොට්ඨාශයේ සියලුම ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශ සඳහා ලැබී ඇද්ද යන්න පරීක්ෂා කරන්න. (වතු නොමැති ග්‍රා.සේ.නි. කොට්ඨාශ සඳහා හිස් ආකෘතියක් තිබිය යුතුය) ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශ අනු පිළිවෙලින් තබා ප්‍රා.උ.දි. කොට්ඨාශ සඳහා වෙනම ලැයිස්තු දෙකක් (අතිරේක පිටපත ද ආධාර කොට ගෙන) සකස් කරන්න. මෙහි 1981 ජන හා නිවාස සංගණනයේදී වතු අංශයෙහි ලා ගණන් ගැනුනු වතු යටින් රතු පැන්සලයකින් ඉරක් ඇඳ එම ආකෘතියේ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා වන තීරය "ඒ" යයි සටහන් කරන්න. ජන හා නිවාස සංගණන වතු ලැයිස්තුවේ සඳහන් පේත අංකයද යොදන්න. වත්තේ නමෙහි වෙනසක් වේ නම් එයද සකස් කරන්න. අනෙකුත් සියලුම වතු සඳහා"බී"යයි සටහන් කරන්න.

මෙලෙස සියලුම ප්‍රා.උ.දි. කොට්ඨාශ සඳහා සම්පූර්ණ කරන ලද වතු ලැයිස්තුවේ මුල් පිටපත් 1981 දෙසැ: 20 දිනට ප්‍රථම නො: 25 ඒ විජේරාම මාවතේ කෘෂිකර්ම සංගණන අංශය වෙත එවිය යුතුය. අනික ඔබ කාර්යාලයේ ආරක්ෂිතව තැබිය යුතුය.

වතු ලැයිස්තුව සකස් කර ගැනීම සඳහා යෝජිත කාල සීමාවන් මෙසේය.

1. 1981 නොවැම්බර් මාසය තුල ආකෘතීන් ග්‍රාමසේවා නිලධාරීන් වෙත බෙදා හැරීම.

11. 1981 දෙසැම්බර් 10 දින හෝ ඊට ප්‍රථම සංශෝධිත වතු ලැයිස්තු ග්‍රා.සේ.නි. ගෙන් සං.වි. වරුන් වෙත ලබා ගැනීම.

111. 1981 දෙසැම්බර් 20 වැනිදාට ප්‍රථම දිස්ත්‍රික්කයේ සියලුම ග්‍රා.සේ.නි. කොට්ඨාශ සඳහා වූ වතු ලැයිස්තු ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගැනීම.

වතු ලැයිස්තු සකස් කිරීමේ උපලේඛන ඔබ වෙත ලැබුනු දින පටන් සංශෝධිත ලැයිස්තු ප්‍රධාන කාර්යාලය වෙත එවන දින දක්වා ප්‍රගති සටහන් තබා ගැනීම සඳහා වන ආකෘතියක් ද මේ සමග එවමි. මෙම සටහන ඔබේ පරීක්ෂාවන් සඳහා මෙන්ම ප්‍රධාන කාර්යාලයෙන් කෙරෙන පරීක්ෂාවන් සඳහා ද ප්‍රයෝජනවත් වන බැවින් කාලෝචිතව පවත්වාගෙන යා යුතුය. ඒ සඳහා අවශ්‍ය වන තොරතුරු සං.වි.වි. ගෙන් ලබා ගැනීමට පිළිවෙල යොදා ගන්නා ලෙස ද සඳහන් කරමි.

මේ ක්‍රියාවලිය යෝජිත කාල සීමාවන් තුල සම්පූර්ණ කර ගැනීමේ හෝ වෙනත් විශේෂ අපහසුතාවන් කොට්ඨාශ භාර සං.වි. වෙත ඇත්නම් හැකි ඉක්මනින් කෘෂිකර්ම සංගණන අංශය වෙත දන්වා එවන මෙන් ඉල්ලමි.

1981.10.29
කෘෂිකර්ම සංගණන අංශය,
25 ඒ, විජේරාම මාවත,
කොළඹ 7.

164

මගේ අංකය: 3/කෘ.සං./82/ව

සංඛ්‍යාලේඛන නිලධාරී,

1982 – කෘෂිකර්ම සංගණනය
වතු අංශය

1982 ජූලි මාසයේ පැවැත්වීමට නියමිතව ඇති ඉහත සංගණනයේ වතු අංශය සංවිධානය කිරීම සඳහා නිවැරදි හා සම්පූර්ණ වතු ලැයිස්තුවක් සකස් කර ගැනීම අවශ්‍යය.

මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ පහත දැක්වෙන උපදෙස් පත්‍රිකා සහ උපලේඛන මේ සමග ඔබ වෙත එවමි.

1. වතු ලැයිස්තු සකස් කිරීම සම්බන්ධව සං.වි. වරුන් වෙත බෙදාදීම සඳහා උපදෙස් පත්‍රිකා.

11. අප වෙත ඇති වතු ලැයිස්තු ආශ්‍රයෙන් ග්‍රා.සේ.නි. කොට්ඨාශ මට්ටමින් සකස් කරන ලද වතු ලැයිස්තු (වතු සඳහන්ව තිබූ ග්‍රා.සේ.නි. සඳහා පමණක්).

111. එක් ග්‍රා.සේ.නි. වරයකුට අවම වශයෙන් දෙක බැගින් සියලුම ග්‍රා.සේ.නි. වෙත වතු ලැයිස්තු සකස් කිරීම සඳහා අවශ්‍ය ආකෘති

1V. සංඛ්‍යාලේඛන නිලධාරී වෙත ප්‍රා.උ.දි. කොට්ඨාශ අනුව ප්‍රගති වාර්තා තබා ගැනීම සඳහා ආකෘති.

වතු ලැයිස්තු සකස් කිරීම සම්බන්ධ උපදෙස් එම පත්‍රිකාවේ සඳහන්ව ඇත.

සම්පූර්ණ කරන ලද වතු ලැයිස්තු 1981 දෙසැම්බර් 20 වන දිනට ප්‍රථම පහත ලිපිනයේ වන කෘෂිකර්ම සංගණන අංශය වෙත ලබා දීම අත්‍යාවශ්‍ය බව අවසාන වශයෙන් ද සඳහන් කරමි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන
අධ්‍යක්ෂ වෙනුවට.

1981. නොවැ: 1 වැනි දින.
කෘෂිකර්ම සංගණන අංශය,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
25 ඒ, විජේරාම මාවත,
කොළඹ 7.

මගේ අංකය: 3/කෘ.සං./82/වතු

.................. දිස්ත්‍රික්කයේ

දිසාපති හා සංගණන කොටයාරිස්,

1982 – කෘෂිකර්ම සංගණනය

වතු අංශය

කෘෂිකාර්මික ව්‍යුහයට අදාල සංඛ්‍යාන එක්රැස් කිරීමේ අරමුණ ඇතිව දිවයින ව්‍යාප්තව පවත්වනු ලබන කෘෂිකර්ම සංගණනය 1982 ජූලි මාසයේ පැවැත්වීමට නියමිතය. එබඳු සංගණනයකදී තොරතුරු රැස් කිරීමේ ඒකකය "ගොවි කාණ්ඩය" වන අතර මෙම ගොවි කාණ්ඩ වැවිලි හෝ වතු අංශය සහ කුඩා ගොවි කාණ්ඩ අංශය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. ප්‍රධාන වශයෙන් අපනයනය සඳහා භෝගයන් වගා කෙරෙන වතු අංශය කෙරෙහි විශේෂ අවධානයකින් ක්‍රියා කළයුතුව ඇත. එම අංශයට අයත් වන සියලුම ඒකකයන්ගෙන් විස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට අදහස් කරන බැවින් සම්පූර්ණ හා නිවැරදි වතු ලැයිස්තුවක් අවශ්‍යය. එබැවින් ඔබ දිස්ත්‍රික්කයේ වතු ලැයිස්තුව සකස් කර ගැනීම සඳහා ඔබගේ සහාය බලාපොරොත්තු වෙමි.

1981 ජන හා නිවාස සංගණනයේදී සකස් කරන ලද වතු ලැයිස්තුවක් ආශ්‍රයෙන් ලබාගත් ග්‍රා.සේ.නි. කොට්ඨාශ වලට අයත් වන වතු ලැයිස්තුව අදාල ග්‍රා.සේ.නි. න් වෙත සපයනු ලැබේ. මෙම ලැයිස්තුවද ප්‍රයෝජනයට ගනිමින් අදාල අර්ථ දැක්වීම් වලට එකඟ වන්නා වූ තම කොට්ඨාශය තුල වන සියලුම වතු අඩංගු ලැයිස්තුවක් එම නිලධාරීන් මගින් සකස් කරවා ගැනීමට අදහස් කරමි.

මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ උපදෙස් පත්‍රිකා සහ උපලේඛන සංඛ්‍යාලේඛන නිලධාරී මගින් කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන විමර්ශක වරුන් වෙත යවා ඇත. එම නිලධාරීන් 1981 නොවැම්බර් මාසයේ ග්‍රා.සේ.නි. සඳහා වන කොට්ඨාශ දිනයකදී අවශ්‍ය අර්ථ දැක්වීම් හා උපදෙස් පැහැදිලි කොට උපලේඛන බෙදා දෙනු ඇත.

විධිමත් හා සම්පූර්ණ වතු ලැයිස්තුවක් සකස් කරවා ගැනීම සහ යෝජිත කාලසීමාවන් තුල ලබා ගැනීම සඳහා සහයෝගය දක්වන ලෙස කොට්ඨාශ භාර ප්‍රාදේශීය උප දිසාපති වරුන් වෙත උපදෙස් දෙන්නේ නම් කෘතඥ වෙමි.

සංගණන අධිකාරී හා
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1981 නොවැ: 02 දින.
කෘෂිකර්ම සංගණන අංශය,
25 ඒ, විජේරාම මාවත,
කොළඹ 7.

පිටපත්: 1. සියලුම ප්‍රා.උ.දි. – දැනගැනීම සඳහා
2. සංඛ්‍යාලේඛන නිලධාරීන් – දැනගැනීම සඳහා.

16

කෘෂිකර්ම සංගණනය - 1982

## වතු ලැයිස්තු සකස් කිරීමේ ප්‍රගති වාර්තාව.

ප්‍රා.උ.දි. කොට්ඨාශයන් සඳහා වූ මෙම වාර්තාව ප්‍රධාන කාර්යාලයෙන් වරින්වර අධීක්ෂණ සඳහා පැමිණෙන නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා යාවත් කාලීනව පවත්වා ගනිමින් සංඛ්‍යාලේඛන නිලධාරී වෙත තබා ගතයුතුය.

1. සං.වි. ගේ නම:-
2. ප්‍රා.උ.දි. කොට්ඨාශයේ නම:-
3. ග්‍රා.සේ.නි. කොට්ඨාශ අංකය:-
4. සං.වි. වෙත උපලේඛන ලබාදුන්/ තැපැල් කල දිනය:-
5. ප්‍රා.උ.දි. නි කොට්ඨාශ දිනය/ ග්‍රා.සේ.නි. වෙත උපදෙස් දුන් දිනය:-
6. වතු ලැයිස්තු ප්‍රගති පරීක්ෂා කිරීම්
   (වතු ලැයිස්තු ප්‍රගති පරීක්ෂා කිරීම සඳහා සං.වි. න්ගේ මාසික යෝජිත වැඩ සටහන් සකස් කිරීමට උපදෙස් දෙන්න.)

| ග්‍රා.සේ.කො. නම | සං.වි. පරීක්ෂා කළ දින (ප්‍රගති) | සං.නි. පරීක්ෂා කළ දින | වතු ලැයිස්තු ලබාගත් දින |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |